## කෝරළේ පත්තු ප්‍රාදේශිය සභාව
## මඩකලපුව දිස්ත්‍රික්කය
---------------------------------

1. මූල්‍ය ප්‍රකාශ
------------------

1.1 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම
--------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2014 මැයි 09 දින ද, ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2013 පෙබරවාරි 07 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 04 දින සභාවේ, සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි.

1.2 මතය
--------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශ වලින් 2013 දෙසැම්බර් 31 දිනට කෝරළේ පත්තු ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම
----------------------------------------

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල වීම
--------------------------------------------------------

පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශ ලේකම්ගේ 2014 ජනවාරි 27 දිනැති පීඑල්/05/පීඒ/එස්එල්පීඑස්ඒඑස් දරන චක්‍රලේඛය අනුව රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

සමාලෝචිත වර්ෂය සඳහා ගෙවියයුතු රු. 16,000 ක්වූ විගණන ගාස්තු වෙනුවෙන් ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

1.3.3 ලැබීයයුතු සහ ගෙවීයයුතු ගිණුම්
----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයෙන් කරනු ලැබේ

(අ) 2004 සිට 2010 වර්ෂය දක්වා හිඟව තිබූ මස් කඩ බදු මුදල් වන රු. 504,135 ක මුදල අයකර ගැනීමට හෝ ඒ සඳහා ප්‍රතිපාදන කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කටයුතු කර නොතිබුණි.

(ආ) බදුකරුවන් පනස්තුන්දෙනෙකුගෙන් අයවිය යුතු බදු මුදල රු. 3,436,360 ක් ඉකුත් වර්ෂ 3 කට වඩා කාලයක සිට හිඟව පැවති නමුදු එය අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

(ඇ) බදු කරුවන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු. 999,000 ක බදු මුදල අයකර ගැනීම සඳහා වසර දෙකකට වඩා වැඩි කාලයක සිට අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

(ඈ) සේවය හැර ගිය සහ විශ්‍රාම ගිය සේවකයන් 10 දෙනෙකුගෙන් අයවියයුතු රු. 131,679 ක ණය ශේෂය මරණ පාරිතෝෂිකයෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට විගණන දිනය වන 2014 ජුලි 31 දක්වා කටයුතු කර නොතිබුණි.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

-----------------------------------

මූල්‍ය ප්‍රකාශ වල දක්වා තිබූ පහත දැක්වෙන විෂයයන් ඉදිරියේ පෙන්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| අයිතමය | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| | රු | |
| ඉඩම් හා ගොඩනැගිලි | 119,544,690 | හිමිකම් ඔප්පු |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 1,362,766 | ස්ථාවර වත්කම් ලේඛන, වත්කම් පිළිබඳ විස්තාරාත්මත උපලේඛන සහ සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| මොටර් වාහන | 3,228,788 | |
| ලී බඩු | 4,572,951 | |
| පරිගණක | 884,815 | |
| පුස්තකාල පොත් | 4,145,182 | |

1.3.5 නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකුල නොවීම

-------------------------------------------------------

පහත සඳහන් අනුකුල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති යනාදියට යොමුව | අනුකුල නොවීම |
|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 134 (1) වගන්තිය | ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ තිබන නිෂ්වල වත්කම් හඳුනාගෙන එම වත්කම්වල වාර්ෂික වටිනාකම් තක්සේරු කර වරිපනම් බදු අය කර ගැනීමට කටයුතුකර තොතිබුණි. |
| (ආ) 1988 වර්ෂයේ ප්‍රාදේශිය සභා (මූල්‍ය හා පරිපාලන ) රීති | |
| (i) 1පරිච්ඡේදයේ 5 (XII) වගන්තිය | මුදල්, ගබඩා ද්‍රව්‍ය සහ චෙක්පත්වලට අත්සන් තැබීම යනාදී කටයුතු නිලධාරින් හතර දෙනෙකුට ක්‍රමානුකුලව භාරදී තිබුණද ඔවුන්ගෙන් ආරක්ෂක ඇප ලබා ගෙන නොතිබුණි. |
| (ii) III පරිච්ඡේදයේ 81 වගන්තිය | ඉඩම් වල අයිතිය පැවරීම සම්බන්ධව මුද්දර බදු ප්‍රතිපූර්ණ කිරීමේ අයදුම්පත් රෙජිස්ටාර් ජනරාල් වෙතද අනෙකුත් ගනුදෙනු සම්බන්ධ බදු ප්‍රතිපූර්ණය කිරීම සඳහාවූ අයදුම්පත් |

මහාභාණ්ඩාගාරයේ අධ්‍යක්ෂකවරයාටද දඩමුදල් ප්‍රතිපූර්ණ කිරීම සඳහාවූ අයදුම්පත් උසාවිවල ලේඛකාධිකාරි වෙතද එක් එක් කාර්තු අවසානයේදි ඉදිරිපත් කර නොතිබුණි.

(iii) X පරිච්ඡේදයේ 191 වගන්තිය — සමාලෝචිත වර්ෂයේ මහා සභා රැස්වීම් තුනක් පවත්වා තිබූ නමුදු, එම රැස්වීම් වාර්තාවල සහතික කළ පිටපත් විගණනයට ඉදිරිපත්කර නොතිබුණි.

(iii) X පරිච්ඡේදයේ 193 වගන්තිය — වර්ෂයට අදාල තථ්‍ය ආදායම් සහ වියදම් සම්බන්ධ විස්තර අයවැය ලේඛනය සමඟ සංසන්දනයකර විචලනය සඳහා පැහැදිලි කිරීම් ඇතුලත් වාර්තාවක් පිළියෙලකර විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශ අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු.4,843,123 ක් වූ අතර ඊට ප්‍රතිරූපිව ඉකුත් වර්ෂයේ ආදායම් ඉක්මවූ පුනරාවර්තන වියදම් රු.1,277,989 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.6,121,112 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

### 2.2 ආදායම් කළමනාකරණය

----------------------------

#### 2.2.1 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

---------------------------------------

සභාව විසින් ඉදිරිපත් කර තිබූ සමාලෝචිත වර්ෂයයේ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් අතර සැළකිය යුතු විචලනයන් නිරීක්ෂණය විය.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | වෙනස | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| බදු | 3,975,000 | 453,670 | 3,521,330 | 88.59 |
| වරෙන්තු ගාස්තු සහ දඩ මුදල් | 7,005,000 | 6,058,067 | 946,933 | 13.51 |

2.2.2 වරිපනම් හා බදු

-----------------

1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 134, 158 සහ 159 වගන්ති අනුව ප්‍රාදේශයේ සභා බල ප්‍රදේශයේ තිබෙන ඉඩම් සහ ඉදිකරන ලද නිවාස, ගොඩනැගිලි සඳහා 1989 වර්ෂයේ සිට 2013 වර්ෂය අවසාන දක්වා වරිපනම් බදු ගණනයකර අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

2.2.3 බදු

---

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාව විසින් බදුකරුවන් හය දෙනෙකුට බදු දී තිබුනද බදු මුදල වන රු. 1,904,600 ක් 2014 ජුලි 31 දක්වා අයකර ගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සන්තිවෙලි පාරු සේවය බදු දීම සම්බන්ධයෙන් එක් මිලගණනක් පමණක් ලැබී රු. 240,100 වාර්ෂික බද්දට ලබා දී තිබුණි. කෙසේවූවද කොන්දේසි අනුව බදු මුදලින් 50% මුදල බදු ගිවිසුම් එළඹි අවස්ථාවේදීම බදු කරුවිසින් නොගෙවා මාස 12ක් ප්‍රමාදවීමෙන් පසු ගෙවා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ නාසීවන් දූපත පාරු බද්ද රු. 105,000 කට ලබා දී තිබුණද බදු මුදලේ අඩක් ඒ අවස්ථාවේදී නොගෙවා තිබූ නමුදු බදු ගිවිසුම සභාව විසින් අත්සන්කර තිබුණි.

2.2.4 වෙනත් ආදායම්

------------------

විවෘත ස්ථානයේ පොල කඩ බදු

----------------------------------

1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 136 වගන්තිය අනුව විවෘත ස්ථානයේ පොල හි කඩ 25 ක් සඳහා 2012 වර්ෂය සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා තක්සේරු දෙපාර්තමෙන්තුව මගින් බදු මුදල් ප්‍රමාණය තක්සේරු කරවාගෙන අයකර නොතිබුණි.

2.2.5 මුද්දර ගාස්තු

--------------

2013 වර්ෂයට අදාලව ලැබියයුතු මුද්දර ගාස්තු ප්‍රමාණය ගණනය කර රෙජිස්ටාර් ජනරාල් වරයාගෙන් අයකර ගැනීම සඳහා විගණන දිනය වන 2014 ජූලි 31 දක්වා කටයුතු කර නොතිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

---------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

----------------------------------

සභාව විසින් පළාත් පාලන ආයතන වල විශ්‍රාම වැටුප් ක්‍රමය සඳහා දායක මුදල් මාසිකව ගෙවීම සඳහා 1995 වර්ෂයේ සිට කටයුතු නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා රු. 2,037,203 දායක මුදලක් ගෙවිය යුතුව තිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

----------------------------------------

4.1 අභ්‍යන්තර විගණනය

------------------------

එක් එක් පළාත් පාලන ආයතන තමන්ගේ හැකියාව අනුව අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා ගතයුතු බව පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය 2005 නොවැම්බර් 08 දිනැති අංක 03 දරන පළාත්පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛයේ 8 වන වගන්තියේ දක්වා තිබෙන නමුත් සභාවේ අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා නොතිබුණි.

5. පද්ධති හා පාලන

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් කළමනාකරණය

(ඇ) ස්ථාවර වත්කම් පාලනය

(ඈ) අයවැය පාලනය